# සරත් සූරසේන මහතාගේ සමුගැනීම

1942-2007



ලාංකීය පිරි සැලසුම් ක්ෂේත්‍රයට නව උදාවක් ඇති කළ පුද්ගලයෙකු ලෙස ඔහුගේ නම ඉතිහාසයේ සනිටුහන් වෙනු ඇත. නූතන පිරි සැලසුම් ශිල්පියාට අද යම් සමාජමය හා සංස්කෘතිකමය වටිනාකමක් තිබේද ඒ ඔහුගේ මහන්සියේ ප්‍රතිඵලයකැයි කීවොත් නිවැරදිය.

ශ්‍රී ලංකා ජාතික කලායතනයේ උගත් ඔහු චිත්‍ර කලා ආචාර්යවරයෙක් ලෙස වසර කිහිපයක් පාසල් සිසුනට චිත්‍ර කලා විෂය ඉගැන්වීය. කර්මාන්ත පිරි සැලසුම් ක්ෂේත්‍රයේ ශිෂ්‍යත්වයක් (Industrial Design) ලැබ සූරසේන මහතා වැඩිදුර ඉගෙනීමට එංගලන්තය බලා ගියේය. එහිදී යුරෝපීය කලාව පිළිබඳ වැඩිදුර අධ්‍යයනයට මෙන්ම කලාගාර නැරඹීමට ද මෙම යුරෝපා සංචාරය නිසා ඔහුට අවකාශය ලැබිණි. ඉන්පසු එතැනින් ඉන්දියාව බලා ගිය ඔහු බටහිර බෙංගාලයේ ශාන්ති නිකේතනයෙන් භාරතීය කලාව වසරක කාලයක් පුරා අධ්‍යයනය කොට සිය විෂය දැනීම් පරාසය පුළුල් කර ගත්තේය.

1960 දශකයේ අවසාන භාගයේ නැවතත් ශ්‍රී ලංකාවට පැමිණි ඔහු පිරිසැලසුම් නිර්මාණ ක්ෂේත්‍රයේ කළමනාකරුවෙකු ලෙස සළුසල ආයතනයේ සේවයට එක් විය. ඉන්පසුව ලංකා පිඟන් සංස්ථාවේ පිරි සැලසුම් නිර්මාණ අධ්‍යක්ෂක තනතුර හෙබවූයේය.

මෙරට පිඟන් කර්මාන්ත ක්ෂේත්‍රය ආරම්භක වකවානුවේ දී පිඟන් නිෂ්පාදන ක්‍රියාවලිය තුළ වඩාත් සැලකිල්ලට සැලකිල්ලට භාජනය වූයේ විiා හා තාක්ෂණික සාධකය පමණකි. මෙහිදී නිර්මාණකරුවාගේ දායකත්වය කිසිදු සැලකිල්ලකට භාජනය නොවීය. නමුත් ඔහුගේ කළමනාකරණ අධීක්ෂණය

යටතේ පිඟන් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා වි\ා තාක්ෂණික වටිනාකමක් ලෙස තක්සේරු කළේ කොපමණ ද ඒ හා සමානවම ඉඩකඩක් නිර්මාණකරුවාට හා නිර්මාණකරණ ක්‍රියාවලියට ලබා දුන් හෙතෙම එතෙක් පසෙකට දමා තිබූ පිරි සැලසුම් ශිල්පියා ගෞරවනීය තලයකට ඔසොවා තැබුවේය.

එමෙන්ම ඒ අතරවාරයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස ද සේවය කළේය. රජයේ කලා හා කලා ශිල්ප වි\ාලය නැවතත් ශ්‍රී ලංකා ජාතික කලායතනය ලෙස භාවිතා කිරීමට මහගම සේකර මහතාගේ යුගයේදී ඔහු හා එක්ව කටයුතු කළ සූරසේන මහතා එතුවක් එහි පැවති කලා ශිල්ප අංශය පිරි සැලසුම් අංශයක් බවට පරිවර්තනය කරමින් ඒ යටතේ ආචාර්යවරුන් ගණනාවක් කලායතනයට බද්ධ කළේය. මෙය එකල හිටපු ආචාර්ය මණ්ඩලයේ සමහරෙකුගේ දෝෂ දර්ශනයට ලක්වුව ද එතැන් පටන් සෞන්දර්ය විශ්ව විද්‍යාලය දක්වා ආයතනයේ දියුණුවට උර දුන් පුද්ගලයෙකු ලෙස කටයුතු කළේය. එමෙන්ම ඔහු ලංකා කලා ඉතිහාසය, භාරතීය කලා ඉතිහාසය හා යුරෝපීය කලා ඉතිහාසය ඉගැන්වීමේදී එක් අතකින් ඔහුගේ ශිල්පීය නිපුණතාවය හේතුවෙන් එම විෂය නිර්දේශයන් දක්ෂ ලෙස ඉගැන්වීමේ ශක්‍යතාවය ඔහු වෙත තිබිණි. එමෙන්ම ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ සභාපති පදවිය දෙවරක්ම ඉසිලූ ඔහු ශ්‍රී ලංකා කලා සංගමයේ සභාපතිවරයා ලෙසත්, ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ චිත්‍ර හා මූර්ති අනුමණ්ඩලයේ සභාපතිවරයා ලෙසත් කටයුතු කර තිබිණි.

දේශපාලනඥයින් විසින් පිරිසැලසුම් ක්ෂේත්‍රයට අත පෙවීමට කිසිදිනක ඉඩ නුදුන් ඔහු කිසිවිටක ඔවුන් ඉදිරියේ කොන්ද නොනැමීය. එම අදීන බවට හේතු වූයේ විෂය දැනුමෙන් ඔහු සන්නද්ධව සිටිය බැවිනි. ක්ෂේත්‍රය තුළ දැවැන්ත චරිතයක් වූ ඔහුගේ හා අනෙකුත් කලාකරුවන් අතර තිබූ වෙනස වූයේ ඔහු නිර්මාණකරණයට මෙන්ම පරිපාලනයට ද අතිදක්ෂයෙකු වීමය. බලධරයින් හා නිලධරයින් සමග ගැටෙමින් ඔහු නිරන්තරයෙන් කලාකරුවාගේ ගමන් මඟ අසුරා තිබූ වැටකඩොළු හෙළි පෙහෙලි කර දුන්නේය.

1994/1995 වසරේ ලාංකීය නූතන පිරි සැලසුම් ක්ෂේත්‍රය සඳහා බුන්කා සම්මානයෙන් ද ඔහු පුද ලැබීය අවුරුදු 65 ආයු වළඳ නික්ම යන සරත් සූරසේන මහතාට අපේ ආචාරය මෙසේ පුදමු!